**<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ iii ශ්‍රේණියේ බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීම - විවෘත</u>**

මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණය ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ iii ශ්‍රේණිය සඳහා පුරප්පාඩු 3ක් සඳහා පත් කර ගැනීමට සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.10.02 වේ.

02. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.03.30, දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය PL -2 සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7.2 වගන්තියේ විධිවිධාන අනුව 2026.01.27 දිනට පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට මේ සඳහා අයදුම් කල හැකිය.

03. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.
තනතුරට අදාල වැටුප් පරිමාණය : රු. 41800 – 10 X 490 -10 X 540 -10 X 590 – 12 X 630 – 65560

(i) අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) තුන්වන මට්ටමට අදාළ වෘත්තීය පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම.

(ii) වෘත්තිය සුදුසුකම් :

| තනතුර | සුදුසුකම් |
|---|---|
| ආයුර්වේද ඖෂධ සංයෝජක | තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( N.V.Q ) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක අදාළ වෘත්තීය පාඨමාලාව හදාරා සහතික ලබා තිබීම. |

(iii) පළපුරුද්ද : i. අදාළ කෙෂ්ත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

ii. ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුර සඳහා පමණක් අදාළ කෙෂ්ත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්දක් තිබිය යුතුය.

(iv)කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත් : i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
iv. බඳවා ගනු ලබන දිනට මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර තුනක (03) ස්ථිර පදිංචිය තහවුරු කළ යුතුය.

(v) වයස :

අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය :(i).විෂයානුබද්ධ දැනුම තීරණය කිරීම සඳහා වන වෘත්තීය පරීක්ෂණයකින් හා සුදුසුකම් හා පළපුරුද්ද පරීක්ෂා කරන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

(ii). විෂයානුබද්ධ දැනුම

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| දේශීය ඖෂධ සංයෝජනය කිරීමේ හැකියාව | 20 | අදාළ නොවේ. |
| දේශීය ඖෂධ අසුරා තැබීම හා ආරක්ෂා කිරීම | 20 | |
| දේශීය ඖෂධ නිකුත් කිරීම සම්බන්ධ දැනුම | 10 | |

(iii). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 30 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

(iv). අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - දැන්වීමේ පල කර ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරගත් අයදුම්පතක් සම්පූර්ණ කර 2026.10.02 දින හෝ එදිනට පෙර ලේකම්, තැ.පෙ. 121, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, සංඝරාජ මාවත මහනුවර ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ iii ශ්‍රේණියේ සඳහා තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම - විවෘත" ලෙස සඳහන් කල යුතුය.

දිනය 2026.09.11

ජගත් අධිකාරි
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය
මධ්‍යම පළාත